ලංසු සඳහා ආරාධනයයි

කොළඹ විශ්වවිද්‍යාලයේ උපකාරක කලාප ගොඩනැගිල්ලේ බිම් මහලේ ආපන ශාලා පහසුකම් (ශ්‍රී ලංකා/චීන/ඉන්දියානු ආහාර) සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවෙන් එහි ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ උපකාරක කලාප ගොඩනැගිල්ලේ ආපන ශාලා (ශ්‍රී ලංකා/චීන/ඉන්දියානු ආහාර) පහසුකම් සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

1. සේවා සැපයුම්කරුවන් 1980 අංක 26 දරන ආහාර පනත යටතේ ලියාපදිංචි සංවිධානයක් විය යුතුය

2. ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රු. 3000/- ක ගාස්තුවක් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් හරහා යොමු අංක **505170600013** දරන විශ්වවිද්‍යාල ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට බැර කර ලබාගත් ලදුපතක් ඉදිරිපත් කිරීමෙන් 2026.11.02 වනදා සිට 2026.11.18 වනදා දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාල මන්දිරයේ ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයෙහි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී හමුවී ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කිරීමට සහ ලබා ගැනීමට කටයුතු සලසා ඇත.

3. ලංසු ලේඛනයෙහි මුල් පිටපත සහ අනුපිටපත පිළිවෙලින් "මුල් පිටපත" සහ "අනුපිටපත" යනුවෙන් ලියන ලද මුද්‍රා තබන ලද ලියුම් කවර දෙකක බහාලිය යුතු අතර අනතුරුව එම ලියුම් කවර දෙක තවත් ලියුම් කවරයක බහාලිය යුතුය. එම ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ පහත සඳහන් යොමු අංකය සඳහන් කළ යුතුය.

4.

	යොමු අංකය	**සේවාව**	ආපසු නොගෙවන ගාස්තුව (රු.)	ආපසු ගෙවන ගාස්තුව (රු.)
01	SSA/HZB/CAN/2027	ආපන ශාලාව (ශ්‍රී ලංකා/චීන/ඉන්දියානු ආහාර)	3000/-	20,000/-

5. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන මුද්‍රා තබා 2026.11.19 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශිෂ්‍ය හා සේවක කටයුතු අංශය,විද්‍යාල මන්දිරය, කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයෙහි පිහිටි සැපයුම් අංශයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම සිදු කළ යුතුය.

6. ආපසු ගෙවනු ලබන රු. 20,000/- ක තැන්පතුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් හරහා යොමු අංක **505170700003** දරන ගිණුමට බැර කළ ගෙවීම් පත්‍රිකාව (payment slip) ලංසු ලේඛනයට ඇමිණීම අනිවාර්ය වේ.

7. ලංසු ලේඛනයේ ඇති උපදෙස් අනුගමනය කිරීමට අපොහොසත් වීම ඔබේ ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතු වේ.
8. දුර. අංක 0112 – 582336 හෝ sar@ssa.cmb.ac.lk විද්‍යුත් තැපැල් ලිපිනය මගින් මේ සම්බන්ධ විමසීම් සිදු කළ හැකිය.
9. පූර්ව ලංසු රැස්වීම 2026.11.13 වන දින පෙ.ව. 10.30 ට කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාල මන්දිරයේ මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. පූර්ව ලංසු රැස්වීමෙන් අනතුරුව එදිනම ස්ථානීය පරීක්ෂාව සඳහා කටයුතු සම්පාදනය කෙරේ.
10. ලංසුව, 2027.02.18 (එනම් ලංසු භාර ගැනෙන අවසන් දිනය වන 2026.11.19 දින සිට දින 92 ක් දක්වා) හෝ සේවාදායකයා විසින් ඉල්ලා සිටින ඕනෑම දීර්ඝ කාලයක් දක්වා වලංගු විය යුතුය.

11. අදාළ ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම 2026.11.19 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාල මන්දිරයේ දී එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94,
කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.